**ගල්ගමුව ප්‍රාදේශීය සභාව**
**කුරුණෑගල දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

-----------------

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

---------------------------------

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 අප්‍රේල් 01 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජූනි 30 දින ද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජූලි 22 දින ද සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

---------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2019 දෙසැම්බර් 31 දිනට ගල්ගමුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-----------------------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මැදගම පෙර පාසල ඉදිකිරීම් වටිනාකම රු.1,296,326 ක් හා කුඩාකත්නෝරුව සුසාන භූමියේ වටිනාකම රු.500,000 ක් ගිණුම්ගත කර නොතිබුණි. | ප්‍රාග්ධන වියදම් හා සියළු වත්කම් නිවැරදිව ගිණුම් ගත කළ යුතු වේ. | පෙර පාසල ඉදිකිරීමේ ගෙවීම් අවසන් කර ඇත්තේ 2020 වර්ෂයේ බැවින් එය ඇතුළත් නොකළ බව සඳහන් කරමි. |
| (ආ) | ඝන අපද්‍රව්‍ය මධ්‍යස්ථානයේ ගබඩාවේ වටිනාකම රු.993,222 ක් වුවද, එය මූල්‍ය ප්‍රකාශනවල රු.700,000 ක් ලෙස දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුවේ. | මේ සඳහා 2020 වර්ෂයේ ගෙවීම් සිදුකළ බැවින් ගිණුම්ගත කර නොමැති බව සඳහන් කරමි. |
| (ඇ) | 2019 දෙසැම්බර් 31 දිනට තොගය රු.3,498,278 ක් වුවද, එය මූල්‍ය ප්‍රකාශනවල රු.3,209,537ක් ලෙස දක්වා තිබුණි. | නිවැරදි තොග වටිනාකම ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුවේ. | තොග එකතුව ගිණුම්වල වෙනස් වී ඇති බව පිළිගනිමි. |
| (ඈ) | සමාලෝචිත වර්ෂය අවසානයට මෝටර් ග්‍රේඩර් ණයගැති ශේෂය රු.5,299,976 ක් වුවද, එය මූල්‍ය ප්‍රකාශනවල රු.4,310,851 ක් ලෙස දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුවේ. | විගණනය විසින් පෙන්වා දී ඇති ණයගැති ශේෂය සඳහා අදාළ මුදල කර්මාන්ත ණයගැති යටතේ දක්වා ඇති බව සඳහන් කරමි. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | 2019 දෙසැම්බර් 31 දිනට අදාළ ලේඛනය අනුව JCB ණයගැති ශේෂය රු.4,850,478 ක් වූ නමුත් මූල්‍ය ප්‍රකාශනවල රු.4,681,150 ක් ලෙස දක්වා තිබුණි. | ලේඛන යාවත්කාලීන කර නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුවේ. | ජේ.සී.බී යන්ත්‍රයට අදාළ උපලේඛනයේ ඇතැම් අයවීම් සටහන් නොවීම හා අත්හැරීම් නිසා විගණනයට එය රු.4,850,478 ක හිඟ ශේෂයක් ලෙස නිරීක්ෂණය වූ බව සඳහන් කරමි. |
| (ඊ) | කීමනී මුදල් අයවීමට නොමැති කඩ කාමර 04 කට අදාළ හිඟ කීමනී ලෙස රු.1,251,441 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | ගිණුම් නිවැරදි කළ යුතුවේ. | 2018 මැයි 05 දින පැවති මහ සභාවේ යෝජනා අංක 5.18.10 යටතේ ලේඛනයෙන් ඉවත් කර ගැනීමට ඒකමතිකව තීරණය වී කොමසාරිස්තුමාට යොමු කර ඇති අතර, එහිදී අනුමැතියක් තවමත් ලැබී නොමැති බැවින්, හිඟයක් ලෙස ලේඛනයෙහි තවදුරටත් පවතී. |
| (උ) | සමාලෝචිත වර්ෂය අවසානයට දේශීය ණය සහා සංවර්ධන අරමුදලට ගෙවිය යුතු ණය ශේෂය රු.12,145,788 ක් වුවද එය රු.12,830,133 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | ගෙවිය යුතු නිවැරදි ණය ශේෂය මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කළ යුතුවේ. | අදාළ ශේෂ වාර්තාවේ පිටපත් මේ සමඟ ඉදිරිපත් කරමි. |
| (ඌ) | අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.7,848,275 ක් වූ ගිණුම් විෂයයන් 06 ක් විගණනයේ දී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන ගිණුම්ශේෂ තහවුරු කෙරෙන ලිඛිත සාක්ෂි ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුවේ. | පැවති ව්‍යසන තත්ත්වය හේතුවෙන් අදාළ ලේඛන ඉදිරිපත් කිරීමට නොහැකි වූ බව පිළිගනිමි. |

**1.4 අනුකූල නොවීම්**

**1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 218 | සභාව සතු සියළු ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳ සමීක්ෂණයක් සිදු කර නොතිබුණි. | රීති ප්‍රකාරව සභාව සතු ඉඩම් පිළිබඳ සමීක්ෂණ කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී සියළු ඉඩම් හා ගොඩනැගිලි පරීක්ෂා කිරීමට කටයුතු කරමි. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | වාහන අභ්‍යන්තර අලුත්වැඩියා සඳහා චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | එම චක්‍රලේඛයේ විධිවිධාන අනුගමනය කිරීමට නොහැකි වූ බව දන්වමි. |

**2. මූල්‍ය සමාලෝචනය**

---------------------

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

-------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.14,757,425 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.12,025,962 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

----------------------

**2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්**

-----------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම් බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2019 වර්ෂය | | | | 2018 වර්ෂය | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | | ඇස්තමේන්තු ගතආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගතආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| I. | වරිපනම් හා බදු | 4,531,635 | 4,412,832 | 4,114,592 | 1,226,515 | 4,328,400 | 4,522,716 | 4,643,676 | 929,139 |
| II. | බදු කුලී | 27,973,972 | 24,310,438 | 22,235,577 | 16,848,124 | 22,042,572 | 21,106,393 | 20,374,031 | 14,773,263 |
| III. | බලපත්‍ර ගාස්තු | 2,082,150 | 1,758,480 | 1,758,480 | 6,000 | 2,057,000 | 3,197,819 | 3,197,819 | 6,000 |
| IV. | වෙනත් ආදායම් | 102,769,287 | 84,650,852 | 103,192,321 | 14,290,270 | 110,804,058 | 70,843,723 | 66,592,525 | 18,541,469 |
| එකතුව | | 137,357,044 | 115,132,602 | 131,300,970 | 32,370,909 | 139,232,030 | 99,670,651 | 94,808,051 | 34,249,871 |

සටහන

----------

2018 හා 2019 වර්ෂවල රැස්කළ ආදායම් අගය තුළ පසුගිය වර්ෂවලට අදාළ හිඟහිටි ලැබීම්ද ඇතුළත්ව තිබුණි.

**2.2.2 වරිපනම් හා බදු**

----------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2015 වර්ෂයේ දේපල තක්සේරු කිරීමෙන් අනතුරුව ඉදිකළ ගොඩනැගිලි 25 ක් සඳහා නව තක්සේරුවක් කර වරිපනම් අය කිරීමට කටයුතු කර නොතිබුණි. | නව ඉදිකිරීම් තක්සේරු කර ගාස්තු අයකිරීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී තක්සේරු දෙපාර්තමේන්තුව මගින් කඩිනමින් තක්සේරුවක් සිදුකර වරිපනම් අයකිරීම සිදුකරන බව සඳහන් කරමි. |

**2.2.3 කුලී**

---------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වාර්ෂික ටෙන්ඩර් මත දේපල බදුදීම්වලින් සමාලෝචිත වර්ෂයට පෙර සිට පැවත එන අවස්ථා 08 කට අදාළව අයවිය යුතු රු.1,400,111ක හිඟ බදු කුලී මුදලක් පැවතුණි. | ගිවිසුම් ප්‍රකාරව බදුකුලී අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | මෙම හිඟ මුදල අයකරගැනීම සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇති බව කාරුණිකව සඳහන් කරමි. |
| (ආ) | 2014 මාර්තු මස වන විට ගෙවා අවසන් විය යුතු පොදු වෙළඳපොල කඩ කාමර 03 කට අදාළව රු.1,146,180 ක් ද, 2019 ජුලි 10 වන විට මුදල් ගෙවා අවසන් විය යුතු කඩහිමියන් 03 කට අදාළව රු.1,896,833 ක් ද, 2019 නොවැම්බර් 28 හා 2020 මාර්තු 06 වන විට ගෙවා අවසන් විය යුතු කඩහිමියන් දෙදෙනෙකුගේ පිළිවෙලින් රු.329,948 ක් හා රු.302,334 ක් ද, බස්නැවතුම්පල කඩ හිමියෙකුගෙන් රු.3,000 ක පෙර ගෙවුම් ශේෂයක් අයවිය යුතුව පැවතුණි. | හිඟ මුදල් අයකර ගැනීම සඳහා ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | මෙම කඩ කාමර සඳහා ඉදිරියේදී ගිවිසුම් ප්‍රකාරව කටයුතු කරන බව දන්වා සිටිමි. |

**2.2.4 වෙනත් ආදායම්**

------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2019 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට තලන රෝල කුලියට දීමෙන් අයවිය යුතු ශේෂයෙන් 2020 ජුනි 17 දින වන විට තවදුරටත් අයවිය යුතු ශේෂය රු.1,196,714 ක් විය. | නියමිත කුලී මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | රු.1,196,714 ක හිඟයද ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරන බව සඳහන් කරමි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2019 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය කුලියට දීමෙන් 2020 ජුනි 17 දින වන විට තවදුරටත් අයවිය යුතු ශේෂය රු.5,256,064 ක් විය. | නියමිත කුලී මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ මුදලින් සෘජු හිඟ මුදල් රු.43,912 ක් ද සහා කර්මාන්ත හිඟ මුදලින් රු.999,375 ක මුදලක් ද ලැබී ඇත. |
| (ඇ) | 2019 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට JCB යන්ත්‍රය කුලියට දීමෙන් 2020 ජුනි 17 දින වන විට තවදුරටත් අයවිය යුතු ශේෂය රු.4,811,402 ක් විය. | නියමිත කුලී මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | මෙයින් සෘජු හිඟ මුදල් 2020 මැයි 31 දිනට ලැබී ඇත. |

## 03. මෙහෙයුම් සමාලෝචනය

--------------------------

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.58,097,681 ක් වූ අතර එයින් වර්ෂයක් හා ඊට වැඩි කාලයක් ඉක්මවා ඇති එකතුව රු.23,004,756 ක් වූ ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. | ණය හිමියන් ගෙවා නිදහස් කිරීමට කටයුතු කරන බවත්, ආරක්ෂිත ඇප තැන්පතු හැර ඉතිරි මුදල් නිරවුල් කර ගැනීමට කටයුතු කරන බවත් දන්වමි. |

### 3.2 මානව සම්පත් කළමනාකරණය

------------------------------------

#### (අ) සේවක පුරප්පාඩු හා අතිරික්ත

------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට අනුමත තනතුරු වල පුරප්පාඩු 13 ක් පැවති අතර, අංක 25/2014 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය යටතේ බඳවාගත් නිලධාරීන් 13 ක් අනුමත කර ගැනීමකින් තොරව සේවයේ යොදවාගෙන තිබුණි. | අත්‍යාවශ්‍ය පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමටත්, අනුමත නොකළ අතිරික්ත සේවක තනතුරු අනුමත කර ගැනීමටත් කටයුතු කළ යුතුවේ. | විගණනය විසින් පෙන්වා දී ඇති තොරතුරු සත්‍ය බව පිළිගනිමි. 25/2014 යටතේ පවතින තනතුරු අනුමත කරගැනීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට යොමුකර ඇත. |

(ආ) වැඩ බැලීමේ දීමනා ගෙවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| වයඹ පළාත් සහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ගේ 2019 පෙබරවාරි 13 දිනැති ලිපියේ 4 වන වගන්තිය ප්‍රකාරව සභාවේ වැඩබලන ලේකම්වරයාගේ නිත්‍ය තනතුරට අදාළ වැටුප් කළමනාකරණ සහකාර අධි ශ්‍රේණියේ ආරම්භක වැටුප් පරිමාණය ඉක්මවා ඇති බැවින් වැඩ බැලීමේ දීමනාවක් හිමි නොවුව ද, 2019 පෙබරවාරි මස සිට 2019 නොවැම්බර් දක්වා රු.54,933 ක වැඩ බැලීමේ දීමනාවක් ගෙවා තිබූ අතර නව පත්වීම් ලිපියට පෙර ද 2016 වර්ෂයේ සිට රු.157,279 ක වැඩ බැලීමේ දීමනා ගෙවා තිබුණි. | පත්වීම් ලිපිය ප්‍රකාරව වැඩබැලීමේ දීමනා ගෙවීමට කටයුතු කළ යුතුවේ. | මෙම ගැටළුව නිරවුල් කරගැනීම සඳහා ආයතන සංග්‍රහය අනුව වැඩ බැලීමේ දීමනාවක් ලබාදෙන ලෙස පළාත් පාලන කොමසාරිස්තුමා මඟින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙතින් ඉල්ලීමක් කර ඇති බැවින් ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව ගෙවීම් කිරීමට අවශ්‍ය පියවර ගැනීමට අදාළ අංශ වෙතින් කටයුතු සලසා දෙන ලෙස ඉල්ලමි. |

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | ගල්ගමුව බස් නැවතුම්පොළ කඩ කාමර සඳහා වසර ගණනාවක සිට ඉතා සුළු මුදලක් අයකරමින් පැවති අතර වයඹ පළාත් පාලන කොමසාරිස්ගේ 2019 ජනවාරි 10 දිනැති අංක 2019/02 චක්‍රලේඛයේ 4 වන වගන්තිය ප්‍රකාරව දේපල තක්සේරු කර ගාස්තු අයකිරීමට කටයුතු කර නොතිබුණි. | තක්සේරු කර ගාස්තු අයකිරීමට කටයුතු කළ යුතුවේ. | තක්සේරුව සඳහා 2017 වසරේ සිට තක්සේරු දෙපාර්තමේන්තුවට ඉල්ලීම් කර ඇත. |
| (ආ) | සභාවට අයත් බහු කාර්ය ගොඩනැගිල්ලේ කඩ කාමර සඳහා 2017 තක්සේරුව ක්‍රියාත්මක කර නොතිබුණු අතර වයඹ පළාත් පාලන කොමසාරිස්ගේ 2019 ජනවාරි 10 දිනැති අංක 2019/02 චක්‍රලේඛයේ 18 (I) වගන්තිය ප්‍රකාරව නිවැරදි බදු ගැණුම්කරුවන් හඳුනාගෙන විධිමත් පරිදි ගිවිසුම්ගත වීමට කටයුතු කර නොතිබුණි. | තක්සේරුව ක්‍රියාත්මක කිරීමට හා චක්‍රලේඛ ප්‍රකාරව ගිවිසුම්ගත වීමට කටයුතු කළ යුතුවේ. | අදාළ ගිවිසුම්ගත වීම සඳහා කැඳවීමේදී බදුකරුවන් ලිඛිතව අභියාචනාවක් ඉදිරිපත් කිරීම නිසා එහි සංශෝධනය සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව වෙත 2018 ජුලි 16 දින ලිඛිතව ඉල්ලීම් කර ඇත. මේ වන තෙක් පිළිතුරු ලැබී නොමැත. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | පදික කඩකාමර සඳහා වූ 2018 පෙබරවාරි 14 දිනැති තක්සේරුව ක්‍රියාත්මක නොකිරීම මත 2019 නොවැම්බර් වන විට සභා අරමුදලට රු.743,925 ක ආදායමක් අහිමිවී තිබුණි. මෙම කඩකාමර සඳහා රු.715 ක කුලියක් අයකරමින් පැවතුණු අතර තක්සේරු වටිනාකම රු. 7,500 හා රු. 8,000 ක් වූ කඩ කාමර 02 ක් පිළිවෙලින් රු. 21,000 කට හා රු.22,000 කට අතුරු බදු ලබා දී තිබුණි. | තක්සේරුව ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු අතර උපබදුදීම් සම්බන්ධයෙන් ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | පදික කඩ කාමර සම්බන්ධව විරෝධතා මත තක්සේරු දෙපාර්තමේන්තුවේ නිර්දේශ බලාපොරොත්තුවෙන් සිටියදී 2019 අගෝස්තු 08 දින මහා සභා අනුමැතිය මත ලැබුණු නිර්දේශ ක්‍රියාත්මක කිරීමට පළාත් පාලන කොමසාරිස් මඟින් අවසරය අපේක්ෂිත ලිපියට ලද පිළිතුරු මත යොමු කළද තක්සේරුවෙන් නැවතත් ප්‍රතිචාර නොමැතිව ක්‍රියාත්මක කර ඇති නමුත් නැවතත් විරෝධතා පැමිණ ඇත. |
| (ඈ) | පොදු වෙළඳපොල කඩ කාමර සඳහා 2011 වර්ෂයේ තක්සේරු වාර්තාව ක්‍රියාත්මක කර නොතිබුණු අතර 2018 පෙබරවාරි 15 දිනැති තක්සේරුව අනුව කුලී අය නොකිරීම නිසා 2019 නොවැම්බර් 30 දිනට රු.905,625 ක ආදායමක් අහිමි වී තිබුණි. ගිවිසුම් ප්‍රකාරව අතුරු බදුදීම කළ නොහැකි වුවද, බොහෝ බදු කරුවන් ඊට අනුකූල නොවන පරිදි කටයුතු කර තිබුණි. | තක්සේරු වාර්තා ක්‍රියාත්මක කළ යුතු අතර අතුරුබදු දීම සම්බන්ධයෙන් ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | එම කඩ කාමර සඳහාද විරෝධතා ලැබීම තුළ සංශෝධනය සඳහා යොමු කළද පළාත් පාලන කොමසාරිස් මගින් 2019 සැප්තැම්බර් 20 දින ලද නිර්දේශය මත මේ වනවිට ගිවිසුම් අත්සන් කර ක්‍රියාත්මක කර ඇත. |
| (ඉ) | බස් නැවතුම්පල කඩ කාමර බදු දීම සම්බන්ධයෙන් වූ ගිවිසුමේ කොන්දේසි ප්‍රකාරව සභාවේ අනුමැතියකින් තොරව අතුරු බදු දීම කළ නොහැකි වුවත් 2019 නොවැම්බර් 28 දින සිදුකළ භෞතික පරීක්ෂාවේ දී මාසික කුලී මුදලට වඩා ඉතා ඉහළ කුලියකට වෙනත් පාර්ශවයන්ට කඩ කාමර අතුරු බදු දී තිබුණි. | අතුරු බදුදීම් සම්බන්ධයෙන් ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | බදුකරු විසින් කුලිය නිසි පරිදි ගෙවන අතර, ගැටළු උද්ගතව නොමැති අතර විගණනය විසින් පෙන්වා දී ඇති කරුණු පිළිබඳව සොයා බලන බව දන්වමි. |

## 3.4 වත්කම් කළමනාකරණය

### 3.4.1 වත්කම් ලේඛන ගත නොකිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් සභාවට පවරා දී ඇති සුසාන භූමි 03ක, මහවැලි සංවර්ධන අධිකාරිය මගින් පවරා දී ඇති සුසාන භූමි 06 ක හා ක්‍රීඩා පිටි 08 ක, සභාව සතු ඉඩම හා ඉහළගම ජල ව්‍යාපෘති ඉඩම යන ඉඩම්වල වටිනාකම තක්සේරු කර ස්ථාවර වත්කම් යටතේ දක්වා නොතිබුණි. | සභාව සතු ඉඩම් තක්සේරු කර ලේඛනගත කිරීමට කටයුතු කළ යුතුවේ. | එම සියළු ඉඩම්වල තක්සේරු වටිනාකම ලබාගැනීමට තක්සේරු දෙපාර්තමේන්තුව වෙත යවා ඇති අතර, එම තොරතුරු ලැබුණු පසු ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කිරීමට කටයුතු කරන බව සඳහන් කරමි. |

### 3.4.2 පවරා නොගත් වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාව විසින් පරිහරණය කරනු ලබන වාහන 02 ක් හා සභාව විසින් නඩත්තු කරනු ලබන සුසාන භූමි 93 ක් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | සභාව විසින් පරිහරණය කරනු ලබන වාහන හා ඉඩම් පවරා ගැනීමට කටයුතු කළ යුතුවේ. | වාහන පවරා ගැනීම් කටයුතු සඳහා ඉදිරියේදී කටයුතු කරන බවත්, සුසාන භූමි පවරා ගැනීමේ කටයුතු සිදුකරමින් පවතින බවත් දන්වමි. |

### 3.4.3 නිශ්ක්‍රීය හා ඌණ උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාව සතුව පවතින රු.189,450 ක් වූ ත්‍රීරෝද රථය කිසිදු ප්‍රයෝජනයකට නොගෙන වසර 05 ක් පමණ නිශ්ක්‍රීය තත්ත්වයේ පැවතුණි. | නිශ්ක්‍රීය වත්කම් අළුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු කළ යුතුවේ. | අපහරණය කිරීම සඳහා අදාළ තොරතුරු පළාත් පාලන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර ඇත. |